සමස්ත ලංකා සමෘද්ධි සංවර්ධන (බැංකු මහ සංගම් හා කාර්යාල) නිලධාරී සංගමය.
ALL ISLAND SAMURDHI DIWALOPMENT (BANK,MAHA SANGAM,OFFICE) OFICECES UNION
ලි.ප. අංකය 7570 - නිළ වෙබ් ලිපිනය - www.oisbku.com

අංක , 68
දෙහිදෙනිය
පේරාදෙනිය
2021.05.07

ගරු සෞඛ්‍ය අමාත්‍ය පවිත්‍රාදේවි වන්නිආරච්චි මැතිතුමිය,

සෞඛ්‍ය අමාත්‍යාංශය

385, බද්දේගම විමලවංශ මාවත,

කොළඹ 10.

## covid 19 එන්නත් කරණ වැඩසටහන සම්බන්ධවයි.

මැතිතුමියණි,

covid 19 වෛරසය රට පුරා ඉතා සීග්‍රයෙන් පැතිරයමින් පවතින මෙම කාල වකවානුව තුල රටේ ජීවත්වන ජනතාවගේ ජීවනෝපාය කටයුතු අඩාලනොවී පවත්වාගෙන යාමට රජය විසින් විවිධාකාර සහනාධාර වැඩසටහන් ක්‍රියාත්මක කරණු ලබයි.එසේම ආර්ථිකය ස්ථාවරව පවත්වාගෙන යාම සඳහා රට වසාතැබීමකින් තොරව ඒ ඒ ආයතනයන්හි වැඩකටයුතු බාධාවකින් තොරව පවතත්වාගෙන යාම සඳහාද අවශ්‍ය කටයුතු සිදුකරගෙන යාමට අවස්ථාව උදාකරදී ඇත. ඉතා සීග්‍රයෙන් පැතිරයන මෙම වෛරය පාලනය කිරීම සඳහා සුවිශාල මෙහෙවරක් සෞඛ්‍ය අංශ,ත්‍රිවිධ හමුදාව,පොලීසිය ආදී ආයතන මූලිකත්වය ගෙන කටයුතු සිදුකරගෙන යනු ලබන බව ඉතාමත් ගෞරවයෙන් සිහිපත් කරමු.

02. එම ආයතන විසින් මෙම වෛරසයේ පාලනය එසේ සිදුකරණුලබන අතර ජනතාවගේ ජීවන තත්වය පහල නොවැටී පවත්වාගෙන යාම සඳහා රජය විසින් ක්‍රියාත්මක කළ රු 5000 ක මුදලක් ජීවනෝපාය අහිමි පවුල් වෙනුවෙන් ලබාදීමේ පලමු පියවරේ සිට මේ දක්වාම එය බිම්මට්ටමින් ක්‍රියාත්මක කළ බලඇණිය වූයේ සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ සමෘද්ධි සංවර්ධන නිළධාරීන් ඇතුළු සමෘද්ධි කාර්ය මණ්ඩලව බව සිහිපත් කරමි.එසේම මෙම කණ්ඩායම මේ මොහොතේද අඩුආදායම්ලාභී පවුල් සඳහා සමාජ ආරක්ෂණ අරමුදල්,සමෘද්ධි සහනාධාර මුදල් ඔවුන්ගේ නිවසටම ගොස් ලබාදීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් සිටින බව දන්වා සිටිමි.තවද මෙම කටයුතු සිදුකිරීමේදී ජීවනෝපාය අහිමි පවුල්,අඩුආදායම්ලාභී පවුල්,විවිධ රෝගාබාධ වලින් පෙලෙන පවුල්,වැඩිහිටි පවුල්,ආදී කණ්ඩායම් සමඟ ඉතා සෘජු සම්බන්ධතාවයක් පවත්වාගෙන යනු ලබනද බව මෙයින් දන්වා සිටිමි.

03. මෙම හේතුව නිසා අප නිළධාරීන්ද,අපගේ සේවා ආයතනය වන සමෘද්ධි බැංකු හා බැංකු කළාප ද නිරෝධායනයට ලක්කළ අවස්ථාද ඇත.කරුණු මෙසේ වනවිට ඉහත සඳහන් කළ අප නිළධාරීන් විසින් ක්‍රියාත්මක කරණු ලබන අත්‍යාවශ්‍ය සේවාවන් අකණ්ඩව පවත්වාගෙන යාම සඳහාත් අප නිළධාරීන්ගේ සෞඛ්‍ය තත්වය ආරක්ෂා කිරීම සඳහා

සභාපති
එන්.ඒ.එම්.අයි.බී.අබේසිංහ
දු:අං: 017-2268463

භාණ්ඩාගාරික
ආර්.ඩී.කේ.සේනාධීර
දු:අං:071-4395535

ප්‍රධාන ලේකම්
බී.එම්.ඒ.වී.බස්නායක
දු:අං: 071-8191473

උප සභාපති
ටී.ජී.දයාවංශ
දු:අං: 071-2585394

උප ලේකම්
බී.ඩී.ජී.වික්‍රමසිංහ
දු:අං:076-5566136

ජාතික සංවිධායක
එච්.ජී.සරත්
දු:අං:071-8105051

අංක , 68
දෙහිදෙනිය
පේරාදෙනිය
2021.05.07

හා මානසික පීඩාව දුරුකිරීම සඳහාත් covid 19 එන්නත් කරණයේදී අප නිළධාරීන්ටද ප්‍රමුඛතාවය ලබාදී ඉතා කඩිනමින් covid 19 එන්න ලබාදීමට අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙසට කාරුණිකව මෙයින් ඉල්ලා සිටිමි.

පිටපත් :- 01. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති
ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා. කා:දැ:පි:

02. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගරු අග්‍රාමාත්‍ය
මහින්ද රාජපක්ෂ මැතිතුමා. කා:දැ:පි:

03. ගරු සමෘද්ධි,ගෘහ ආර්ථික,ක්ෂුද්‍රමූල්‍ය,ස්වයංරැකියා,ව්‍යාපාර සංවර්ධන
හා ඌණ උපයෝජන රාජ්‍ය සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍ය
ෂෙහාන් සේමසිංහ මැතිතුමා. කා:දැ:පි: හා අ:කා:ස:

04. සෞඛ්‍යසේවා අධ්‍යක්ෂ ජනරාල් තුමා. කා:දැ:පි: හා අ:කා:ස:

05. සමෘද්ධි,ගෘහ ආර්ථික,ක්ෂුද්‍රමූල්‍ය,ස්වයංරැකියා,ව්‍යාපාර සංවර්ධන
හා ඌණ උපයෝජන රාජ්‍ය සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශ ලේකම් තුමා. කා:දැ:පි: හා අ:කා:ස:

06. සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් තුමා. කා:දැ:පි: හා අ:කා:ස:

සභාපති
එන්.ඒ.එම්.අයි.බී.අබේසිංහ
දු:අං: 017-2268463

භාණ්ඩාගාරික
ආර්.ඩී.කේ.සේනාධීර
දු:අං:071-4395535

ප්‍රධාන ලේකම්
බී.එම්.ඒ.වී.බස්නායක
දු:අං: 071-8191473

උප සභාපති
ටී.ජී.දයාවංශ
දු:අං: 071-2585394

උප ලේකම්
බී.ඩී.ජී.වික්‍රමසිංහ
දු:අං:076-5566136

ජාතික සංවිධායක
එච්.ජී.සරත්
දු:අං:071-8105051